# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/45 – 2016 නොවැම්බර් 10 වැනි බ්‍රහස්පතින්දා – 2016.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 275 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2013/ඩබ්ලිව්එස්/461.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 9/3/1/1/බී.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ජේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, යටවත්ත.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරිය පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, පුංචිලෙවකන්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ma/YTT/2016/257 හා 2016.07.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012ක් පමණ වන මහලෙවකන්ද වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මහලෙවකන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1012ක් පමණ**

උතුරට: මාර්ගය සහ හපුකොටුවේ ගෙදර ඩික්සන් හපුකොටුව හිමිකම් කියන මහලෙවකන්ද වත්ත; නැගෙනහිරට,දකුණට සහ බටහිරට: හපුකොටුවේ ගෙදර ඩික්සන් හපුකොටුව හිමිකම් කියන මහලෙවකන්ද වත්ත.

11 - 1135


1A – G 24529 – 32 (2016/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*